# පුරප්පාඩු

## කළමනාකරු (මුල්‍ය හා අලෙවි ) තනතුර

**තේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ විශිෂ්ඨයකු ලෙස නම් දරා සිටින සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ කළමණාකරු (මුල්‍ය හා අලෙවි) තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**සුදුසුකම් හා පළපුරුද්ද**

| බාහිර අයදුම්කරුවන් | අභ්‍යන්තර අයදුම්කරුවන් |
|---|---|
| <u>අධ්‍යාපන සුදුසුකම්</u><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක කළමනාකරණය හෝ වාණිජවේදී උපාධියක් සහ අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබාතිබීම.<br>හෝ<br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ (ICASL) හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CIMA) හෝ එක්සත් රාජධානියේ වරලත් සහතික ලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ (ACCA) පූර්ණ සාමාජිකත්වය ලබාතිබීම.<br><br><u>පළපුරුද්ද</u><br>උපාධි සුදුසුකම් හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ (ICASL) හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CIMA) හෝ එක්සත් රාජධානියේ වරලත් සහතික ලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ (ACCA) පූර්ණ සාමාජිකත්වය ලබාගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් සමඟ සතුටුදායක සේවා වාර්තාවක් තිබීම. | බාහිර සුදුසුකම්<br>හෝ<br>සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ කළමනාකාර සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි වසර පහකට (05) නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |

වයස අවු. 35 ට නොඅඩු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

| මාසික වැටුප් පරිමාණය | අනෙකුත් වරප්‍රසාද |
|---|---|
| කළමණාකරන සේවා 2/2016 චක්‍රලේඛනය අනුව වැටුප් හා දීමනා ගෙවනු ලැබේ.<br>HM 1-1 රු. 81,670/- 15 x 2,270/- 115,720/-<br><br>වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව රු. 7,800.00 ක්, රජයේ අනුමත දීමනාව රු. 5,000.00 ක් හා ප්‍රවාහන පහසුකම් හෝ රජයේ අනුමත ප්‍රවාහන දීමනාව, රජයේ අනුමත දුරකථන දීමනාව ආදිය හිමි වේ. | • වාර්ෂික ප්‍රසාද දීමනා<br>• ආකර්ශනීය වෛද්‍ය රක්ෂණාවරණයක් (පවුලේ සාමාජිකයින් ඇතුළුව)<br>• සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල්<br>• මාසික තේ කොළ දීමනාව<br>• සේවකයින් වෙත ලබා දෙන අනෙකුත් දීමනා සහ වරප්‍රසාද |

ඔබගේ අයදුම්පත ජීව දත්ත සමඟ අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කල හැකි සහතිකවල පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය

තවද, දැනටමත් රජයේ, සංස්ථා, මණ්ඩලවල සේවයේ යෙදීසිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

සෑම අයදුම්කරුවෙක්ම මනා ශරීර සෞඛ්‍යකින් හා ධනාත්මක අදහස්වලින් පිරි ක්‍රියාශීලි අයෙකු විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ හැකියාව තිබිය යුතුය.

තෝරා ගැනීම සඳහා කිනම් අයුරකින් හෝ අනිසි බලපෑම් කිරීම නුසුදුසුකමට හේතු වනු ඇති අතර, අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අවසාන තීරණය වේ.

ඉහත සුදුසුකම් සපුරා ඇති ඔබගේ ආදර්ශ ආකෘතියට (kalubowitiyanatea.lk වෙබ් අඩවියෙන් බාගත හැක) අනුව සකස් කරන ලද අයදුම්පත්‍රය 2023.11.18 දිනට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ වම් කෙළවර ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති, සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම, නො. 53, රත්නායක මාවත, පැලවත්ත, බත්තරමුල්ල**